# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/17 - 2020 ජනවාරි මස 22 වැනි බදාදා - 2020.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයාට වහාම ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් විෂයයන් සහ කාර්යයන් පැවරීම සිදු කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විමල් වීරවංශ,
කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 10 වැනි දින.

**උපලේඛනය**

**ගරු දයාසිරි ජයසේකර, කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය කිරීම<br>2. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට බලපාන බාධක හා අභියෝග වලට සාර්ථක ලෙස මුහුණ දීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් හඳුන්වා දීම.<br>3. දේශීය කර්මාන්තයක් වශයෙන් ජාත්‍යන්තරය තුළ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රචලිත කිරීම සඳහා අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම. | 1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br>2. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය | • ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50) |

02 - 36